සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 16 - විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය

# (නව/පැරණි නිර්දේශය)

ලකුණු දීමේ පටිපාටිය

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 16 - විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය

## (නව හා පැරණි නිර්දේශ)

### ලකුණු බෙදී යාමේ ආකාරය

| | | | | |
|---|---|---|---|---|
| I පත්‍රය | - | 1 x 50 | = | 50 |

II පත්‍රය

| | | |
|---|---|---|
| A කොටස | - | 40 |
| B කොටස | - | 30 |
| C කොටස | - | 30 |
| | | 100 |

මුළු ලකුණු - $50 + \frac{100}{2}$ = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ :ප්‍රශ්න අංක 03

(i) ..................................................
..................................................
.................................................. √ △ 4/5

(ii) ..................................................
..................................................
.................................................. √ △ 3/5

(iii) ..................................................
..................................................
.................................................. √ △ 3/5

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020


| | | |
|---|---|---|
| විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය I<br>மின், இலத்திரன், தகவல் தொழினுட்பவியல் I<br>Electrical, Electronic and Information Technology I | 16 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |


උපදෙස් :


* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.


**1.** NPN ට්‍රාන්සිස්ටරය නිරූපණය කරන සංකේතය තෝරන්න.

(1) 

(2) 

(3) 

(4) 

(5) 


**2.** ශ්‍රී ලංකාවේ ගෘහස්ථ විදුලි සැපයුමේ නාමික සංඛ්‍යාතය කුමක් ද?


(1) 49.5 Hz (2) 50 Hz (3) 50.5 Hz (4) 55 Hz (5) 60 Hz


**3.** රසදිය වල විශිෂ්ට ගුරුත්වය 13.6 වේ. 700 mm දිග රසදිය කඳක පතුලේ ඇතිවන පීඩනය සමාන වන්නේ, ($g = 9.81\ m\ s^{-2}$ බව සලකන්න.)


(1) 1 atm ය. (2) 100 kN ය. (3) 100 kPa ය. (4) 93391 Pa ය. (5) 101396 Pa ය.


**4.** උස ගොඩනැගිල්ලක මුදුනේ සිට බෝලයක් අත් හරිනු ලැබේ. වාතය තුළ බෝලයේ චලිතය පහත සඳහන් කුමන ත්වරණ-කාල ප්‍රස්ථාරය මගින් දක්වන්නේ ද? (වාතයේ ප්‍රතිරෝධය නොමැති බව සලකන්න.)

(1) 



(2) 


(3) 


(4) 


(5) 

5. මයික්‍රොමීටර් ඉස්කුරුප්පු ආමානයකින් ගත් වැඩ කොටසක මිනුමක් රූපයේ දැක්වේ. මයික්‍රොමීටර් ඉස්කුරුප්පු ආමානයේ ශුන්‍යතා දෝෂ නොමැත. මෙම ආමානයේ කුඩාම මිනුම 0.01 mm වේ. පහත රූපයේ දැක්වෙන මයික්‍රොමීටර් ඉස්කුරුප්පු ආමානයේ පාඨාංකය කුමක් ද?





(1) 20.33 mm (2) 20.66 mm (3) 22.33 mm (4) 25.30 mm (5) 22.00 mm

6. පරිගණක ඒකකයක දෘඪාංගයක් නොවන උපාංගය මින් කුමක් ද?

(1) දෘඪ තැටිය (2) යතුරු පුවරුව (3) මූසිකය
(4) මොනිටරය (5) මාර්ගගත ආචයන ඉඩ (online storage space)


7. පහත පරිපථ සටහන් සලකන්න.




ඉහත පරිපථ අතුරෙන් අවම ධාරාවක් සහිත පරිපථය/පරිපථ කුමක් ද?

(1) A පමණි. (2) B පමණි. (3) D පමණි.
(4) A සහ B පමණි. (5) C සහ D පමණි.


8. යන්ත්‍ර කොටසක ප්‍රක්ෂේපිත පෙනුමක් රූපයේ දැක්වේ.




පිළිවෙළින් $A, B, C, D$ හා $E$ මගින් දක්වා ඇති රේඛා වර්ග වන්නේ,


(1) මායිම් රේඛාව, මධ්‍ය රේඛාව, සැඟි රේඛාව, විස්තාරිත රේඛාව සහ මාන රේඛාව වේ.
(2) මායිම් රේඛාව, මධ්‍ය රේඛාව, සැඟි රේඛාව, මාන රේඛාව සහ විස්තාරිත රේඛාව වේ.
(3) මායිම් රේඛාව, සැඟි රේඛාව, මධ්‍ය රේඛාව, විස්තාරිත රේඛාව සහ මාන රේඛාව වේ.
(4) මායිම් රේඛාව, සැඟි රේඛාව, මධ්‍ය රේඛාව, මාන රේඛාව සහ විස්තාරිත රේඛාව වේ.
(5) විස්තාරිත රේඛාව, මධ්‍ය රේඛාව, සැඟි රේඛාව, මායිම් රේඛාව සහ මාන රේඛාව වේ.

**9.** පහත පරිපථයේ *A* හා *B* ලක්ෂ්‍ය අතර ප්‍රතිරෝධය කුමක් ද?




(1) 1.5 kΩ (2) 3 kΩ (3) 6 kΩ (4) 9 kΩ (5) 12 kΩ


**10.** පහත ප්‍රස්ථාර සලකන්න.




ආදාන *A* හා ආදාන *B* තර්ක ද්වාරයකය ආදානවලට සම්බන්ධ කර ඉහත දැක්වෙන තර්ක ප්‍රතිදානය නිරීක්ෂණය කරන ලදී. මෙහි 5 V හා 0 V මගින් පිළිවෙළින් තර්ක '1' හා තර්ක '0' දක්වනු ලැබේ.
ඉහත ප්‍රස්ථාර ඇසුරෙන් තර්ක ද්වාරය හඳුනාගන්න.

(1) AND (2) OR (3) NOT (4) NOR (5) NAND


**11.** රූපයේ දක්වා ඇති ආකාරයට 100 kg ස්කන්ධයක් ඝර්ෂණය රහිත කප්පි පද්ධතියක එල්ලා ඇත. මෙම පද්ධතිය සමතුලිතව පවත්වා ගැනීම සඳහා නිදහස් කෙළවර P හි යෙදිය යුතු බලය නිවටන්, (කප්පි පද්ධතියේ බර නොසලකා හරින්න. ගුරුත්වජ ත්වරණය ($g$) = 9.81 m $s^{-2}$ ලෙස සලකන්න.)





(1) 10$g$ වේ. (2) 25$g$ වේ. (3) 33$g$ වේ.


(4) 50$g$ වේ. (5) 100$g$ වේ.

12. A දෙසින් ප්‍රක්ෂේපණය කලවිට නිවැරදි පෙනුම දක්වන්නේ මින් කුමක් ද?





(1)




(2)



(3)




(4)



(5)

13. පාලමක යොදා ඇති බැල්ටිමෝර් කාප්ප හැටුමක් රූපයේ දැක්වේ. මෙම කාප්ප හැටුම සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.


A - *LE* කොටසේ බලය 5 kN වලට වඩා වැඩිය.
B - *ML* හා *LK* කොටස්වල බල සම්පීඩන බල වේ.
C - පතුල් කොටස් වල බල ආතතික වේ.
D - *NB* හා *NC* කොටස් කාප්ප හැටුමේ ආරක්ෂාව වැඩි කරයි.




ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ

(1) A, B සහ C පමණි.
(2) A, B සහ D පමණි.
(3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ලම.

**14.** රූපයේ දැක්වෙන සාමාන්‍ය දොර සරනේරුවක භාවිත කරන පිත්තල ඉස්කුරුප්පු ඇණයක් සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.



A - එහි හුලස් හැඩය, ඉස්කුරුප්පු නියනක් භාවිතයෙන් ඇණය ඇතුල් කිරීමට උපකාරී වේ.
B - හෙලික්සීය පොටේ ඝර්ෂණ ප්‍රතිරෝධය මගින් ඉස්කුරුප්පු ඇණය තදින් අල්ලාගෙන සිටිනු ලැබේ.
C - ඉස්කුරුප්පු කඳ ආතන්‍ය ප්‍රතිරෝධයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ.
D - දොරේ බර නිසා ඇතිවන බලය ඉස්කුරුප්පු කඳ මගින් දරා සිටිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එහි භාවිතය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ ඉහත කිනම් ප්‍රකාශ ද?

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම.


**15.** පහත ප්‍රකාශ සලකන්න.


A - සියුම් කාබන් අංශු මිනිස් පෙනහළු තුළ ශ්වසන අපහසුතා ඇති කරයි.
B - මත්ස්‍යයින් තුළ රසදිය ඒකරාශී වේ.
C - ගල් අඟුරු පිළිස්සීම නිසා හමන අළු (fly ash) කඳු තුළ බැර ලෝහ ඒකරාශී වේ.
D - මෝටර් වාහන විමෝචන (emissions) පක්ෂීන් තුළ ඒකරාශී වීම.

ඉහත කිනම් ප්‍රකාශ මගින් ජෛව සමායවනයේ (bioaccumulation) බලපෑම් විස්තර කරනු ලබයි ද?


(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම

**16.** කම්බි රැඳවුම් අල්ලුවක සමාංශක පෙනුමක් රූප සටහනේ දැක්වේ. පිළිවෙළින් ***A*** හා ***B*** ඊතල දෙසින් බලන විට නිවැරදි ඍජු ප්‍රක්ෂේපණ පෙනුම් මොනවා ද?



**17.** 800 N බර ඇති $AB$ දණ්ඩ රූපයේ දැක්වෙන ආකාරයකට රඳවා තිබේ. $B$ හි ස්පර්ශ පෘෂ්ඨය සුමට වේ. බිත්තියේ $A$ ස්ථානයේ ස්ථිතික ඝර්ෂණ සංගුණකය (බිත්තිය හා දණ්ඩ අතර) 0.2 වේ. දණ්ඩ රූටා යාමකින් තොරව තබා ගැනීම සඳහා යෙදිය යුතු අවම බලය $P$ වන්නේ,




(1) 221 N වේ. (2) 321 N වේ. (3) 421 N වේ.

(4) 433 N වේ. (5) 533 N වේ.

**18.** පහත ප්‍රකාශ සලකන්න.

A - දිගක් මැනීම සඳහා මීටර් කෝදුව භාවිත කරන විට කුඩාම මිනුම 0.0005 m වේ.
B - ශක්තිය (energy) මැනීම සඳහා SI ඒකකය කැලරි වේ.
C - වොල්ටීයතාවය 1.5 V වන දීප්ත කෝෂ වල SI ඒකකය කැන්ඩෙලා (Cd) වේ.
D - සින්ක්-කාබන් AA බැටරිවල නාමික කෝෂ වොල්ටීයතාව 1.5 V වේ.

ඉහත කිනම් ප්‍රකාශ සත්‍ය වේ ද?

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම.

**19.** පහත ප්‍රකාශ සලකන්න.

A - උපාංග සවිකිරීමට හෝ ගැලවීමට හෝ පෙර මෝටරයේ බල සැපයුම ක්‍රියා විරහිත කිරීම.
B - හදිසි නැවතුම් බොත්තම ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීම.
C - ගෙබිම පිරිසිදු හා තෙලිස්සන සුළු වීම.
D - මිනුම් ගැනීමේ දී භ්‍රමණ වේගය අඩු කිරීම.

ලියවන පට්ටලයක් (lathe machine) ක්‍රියාත්මක කිරීමේ දී අදාළ ආරක්ෂක පියවර ඉහත කිනම් ප්‍රකාශ මගින් විස්තර කරනු ලබයි ද?

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම.


**20.** පහත ප්‍රකාශ සලකන්න.

A - ටර්පන්ටයින් වල දියවන ස්වාභාවික දුම්මල, දැව සංරක්ෂණය සඳහා භාවිත වාර්නිෂ් වල අඩංගු විය හැකි ය.
B - ඇලුමිනියම් සල්ෆේට් ජලයේ අවලම්බිත ඝන ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා භාවිත කළ හැකි කැටියම් ද්‍රව්‍යයකි.
C - වීදුරු නිෂ්පාදනයේ දී භාවිත වන ප්‍රධාන සංඝටකයක් වන්නේ සිලිකා ය.
D - වස්තු දෙකක් මැලියම් ගා ඇලවීමේ දී හොඳ බන්ධනයක් ඇතිවීමට අධික පෘෂ්ඨීය රළු බව හේතු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් රසායනික සංයෝග භාවිතය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ මොනවාද?

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම.

**21.** ක්‍රීඩකයෙක් 150 g ක ටෙනිස් බෝලයකට ටෙනිස් පිත්තකින් පහරක් එල්ල කරනු ලබයි. රූපයේ දක්වා ඇති ආකාරයට එම බෝලයේ ප්‍රවේග වෙනස්වීම සිදු වේ. මෙහි ගම්‍යතා වැඩිවීම කුමක් ද?




(1) 1.5 $kgms^{-1}$ (2) 2.5 $kgms^{-1}$ (3) 5.5 $kgms^{-1}$

(4) 7.5 $kgms^{-1}$ (5) 10.0 $kgms^{-1}$


**22.** පහත ප්‍රකාශ සලකන්න.

A - ඇණවුම නිරීක්ෂණය (track) කිරීමේ හැකියාව හා භාරදෙන දිනය සඳහන් කිරීම.
B - නිෂ්පාදනයේ පවතින තොග, මිල හා ආදේශ ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු සැපයීම.
C - නිෂ්පාදන සම්බන්ධ පාරිභෝගික අදහස් ලබාදීම.
D - ගණුදෙනු කාලය හා සම්බන්ධිත පිරිවැය අඩු වීම.

ඉහත කිනම් ප්‍රකාශ මගින් පිළිගත් මාර්ගගත සාප්පු ව්‍යාපාරයක ව්‍යවසායික ගති ලක්ෂණ විස්තර වන්නේ ද?

(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D සියල්ලම.

**23.** පහත පරිපථය සලකන්න. මෙම පරිපථයට පරිපූර්ණ ඇමීටර සම්බන්ධ කර ඇති අතර ඒවායේ පාඨාංක $M_1$, $M_2$, $M_3$ සහ $M_4$ වේ.




පහත ප්‍රකාශ අතුරෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?

(1) $M_1$ හි අගය $= M_2 + M_3 + M_4$
(2) $M_3$ හි අගය $= 1\,A$
(3) $M_4$ කුඩාම පාඨාංකය වේ.
(4) $M_1$ වැඩිම පාඨාංකය වේ.
(5) $M_1$ හි අගය $> (M_2 + M_3 + M_4)$


**24.** නිවසක 5 W LED පහන් දහයක් භාවිත කරනු ලැබේ. සෑම පහනක් ම දිනකට පැය 5 ක් බැගින් දැල්වේ. මෙම නිවසේ දෛනික විද්‍යුත් ශක්ති පරිභෝජනය කීයද?

(1) 0.025 kW h (2) 0.25 kW h (3) 2.5 kW h (4) 25 kW h (5) 250 kW h

**25.** වෙරළාසන්න ප්‍රදේශයේ යකඩ ව්‍යුහයක විඛාදනය වේගවත් කිරීම (corrosion) සඳහා හේතුව නිවැරදි ව පැහැදිලි කරනුයේ කුමන ප්‍රකාශය මගින් ද?


(1) වෙරළාසන්න ප්‍රදේශවල ඔක්සිජන් සැපයීම සඳහා ප්‍රමාණවත් ශාක නොමැත.
(2) විඛාදනය වේගවත් කිරීම සඳහා උපකාරී වන ලවණ වෙරළාසන්න ප්‍රදේශවල සුළගේ අන්තර්ගත වේ.
(3) වෙරළාසන්න ප්‍රදේශවල පවතින අධික තාපය විඛාදනය වේගවත් කිරීමට හේතු වේ.
(4) වෙරළාසන්න ප්‍රදේශවල පවතින අධික සූර්ය ප්‍රවිකිරණය (irradiation) විඛාදනය වේගවත් කිරීමට හේතු වේ.
(5) සාගරයේ උදම් රළ ලෝහවල විඛාදනය වේගවත් කිරීමට හේතු වේ.


**26.** රූපයේ දී ඇති ගෘහස්ථ පරිපථයක රේඛා සටහන සලකා එය අයත් වන නිවැරදි පරිපථ වර්ගය තෝරන්න.






(1) පහනක් හා වහරුවක් සහිත පරිපථයක්
(2) දෙමං වහරු සැකසුමක් සහිත පරිපථයක්
(3) කෙවෙනි පිටවාන් තුනක් හා පහනක් සහිත පරිපථයක්
(4) පහන් තුනක් සහිත පරිපථයක්
(5) කෙවෙනි පිටවාන් තුනක් සහිත පරිපථයක්


**27.** සරල ධාරා (DC) ශ්‍රේණිගත මෝටර පරිපථය තෝරන්න.

(1)



(2)


(3)


(4)


(5)


**28.** පහත රූපයේ දැක්වෙන ආකාරයට ධාරිත්‍රක දෙකක් සම්බන්ධ කර ඇත.




| | හරස්කඩ වර්ගඵලය | තහඩු අතර දුර | පාරවේද්‍යතාව |
|---|---|---|---|
| $C_1$ | $A$ | $d$ | $\varepsilon$ |
| $C_2$ | $2A$ | $2d$ | $10\varepsilon$ |


$P$ හා $Q$ ජාලය හරහා සමක ධාරණාව කුමක් ද?


(1) $\frac{\varepsilon A}{d}$  (2) $\frac{2\varepsilon A}{d}$


(3) $\frac{4\varepsilon A}{d}$  (4) $\frac{11\varepsilon A}{d}$


(5) $\frac{40\varepsilon A}{d}$


**29.** නිවැරදි තෙකලා තරංග හැඩය තෝරන්න.

(1)




(2)




(3)



(4)



(5)


**30.** පහත සැකසුම පරිපථයකට යොදා විභව අන්තරය (V) හා ධාරාව (I) නිරීක්ෂණය කරන ලදී. තරංග හැඩ පහත ප්‍රස්තාරයේ ආකාරයට නිරීක්ෂණය විය.




ඉහත උපාංගය වන්නේ,

(1) ප්‍රතිරෝධකයයි. (2) පරිපූර්ණ ධාරිත්‍රකයයි. (3) පරිපූර්ණ ප්‍රේරකයයි.
(4) ට්‍රාන්සිස්ටරයයි. (5) ඩයෝඩයයි.


**31.** මාර්ගගත පාඩම් පැවැත්වීම (online delivery of lessons) සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.


A - ඉගැන්වීම සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් භාවිත කළ හැකි ය.
B - පරිගණක සඳහා මයික්‍රෝෆෝන සහ වීඩියෝ කැමරා වැනි දෘඩාංග අවශ්‍ය වේ.
C - කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා මාර්ගගත ලියවිලි (online documents) භාවිත කළ හැකි ය.


මේවායින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ සහිත වරණය තෝරන්න.

(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) A සහ C පමණි. (5) A, B සහ C සියල්ලම.

**32.** තරංග හැඩ තුනක් පහත රූපවල දක්වා ඇත.








පිළිවෙළින් $x(t), y(t)$ සහ $z(t)$ වල සාමාන්‍ය අගය කුමක් ද?


(1) 2.5 V, 2.5 V, 2.5 V (2) 0 V, 2.5 V, –2.5 V (3) 0 V, 0 V, 0 V
(4) 0 V, –2.5 V, 2.5 V (5) –2.5 V, –2.5 V, 0 V

**33.** පහත තාර්කික පරිපථය සඳහා සමාන වන තාර්කික ද්වාරය කුමක් ද?




(1) NOR		(2) NAND		(3) XOR		(4) OR		(5) AND

**34.** පහත තාර්කික පරිපථයේ ප්‍රතිදානය කුමක් ද?




(1) $AB + \overline{C}$		(2) $\overline{(A + B) + \overline{C}}$		(3) $\overline{AB + \overline{C}}$		(4) $\overline{AB} + C$		(5) $\overline{AB + C}$

**35.** අර්ධ සන්නායක සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - බාහ්‍ය අර්ධ සන්නායක වලට අපද්‍රව්‍ය එක් කිරීමෙන් නිසග අර්ධ සන්නායක සාදනු ලබයි.


B - Si සමග As මාත්‍රණය කිරීමෙන් n වර්ගයේ අර්ධ සන්නායකයක් සෑදිය හැකි ය.


C - Si සමග P මාත්‍රණය කිරීමෙන් p වර්ගයේ අර්ධ සන්නායකයක් සෑදිය හැකි ය.


මේවායින් අර්ධ සන්නායක සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ/ප්‍රකාශය තෝරන්න.


(1) A පමණි.		(2) B පමණි.		(3) A සහ B පමණි.
(4) B සහ C පමණි.		(5) A, B සහ C සියල්ලම.


**36.** පිළිවෙළින් NPN ද්විධ්‍රැවීය සන්ධි (BJT) ට්‍රාන්සිස්ටරයක්, n-නාලි සන්ධි ක්ෂේත්‍ර ආවරණ ට්‍රාන්සිස්ටරයක් (JFET), n-නාලි වර්ධක ලෝහ ඔක්සයිඩ අර්ධ සන්නායක ක්ෂේත්‍රඵල ආවරණ ට්‍රාන්සිස්ටරයක් (MOSFET) දැක්වෙන්නේ කුමන වරණයේ ද?

(1) 

(2) 

(3) 


(4) 


(5) 


**37.** පොදු විමෝචක වින්‍යාසය සහිත වර්ධකයක් ලෙස NPN BJT ට්‍රාන්සිස්ටරයක් යොදා ඇත. ට්‍රාන්සිස්ටරය සක්‍රිය කලාපයේ පවතින අතර $I_B=20\,\mu A$ සහ $\beta=100$ වේ. සංග්‍රාහක ධාරාව $I_c$ නිශ්චය කරන්න.


(1) 200 nA
(2) 20 $\mu$A
(3) 2 mA
(4) 200 $\mu$A
(5) $I_c$ නිශ්චය සඳහා දත්ත ප්‍රමාණවත් නොවේ.


**38.** සිලිකන් වලින් සාදන ලද ඩයෝඩ සහිත පහත පරිපථයට ආදානය වශයෙන් පහත දක්වා ඇති සයිනාකාර වෝල්ටීයතා සැපයුමක් දෙන ලදී. ධාරිත්‍රකය හරහා වෝල්ටීයතාවය $V_c$ කුමක් ද?









(1)



(2)



(3)



(4)



(5)


**39.** පරිපූර්ණ කාරකාත්මක වර්ධකයක් සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.

A - විවෘත-පුඩු වෝල්ටීයතා ලාභය අනන්ත වේ.

B - ප්‍රදාන ප්‍රතිරෝධය අනන්ත වේ.

C - ප්‍රතිදාන ප්‍රතිරෝධය 100 Ω වේ.


D - අපවර්තිත හා අපවර්තිත නොවන ආදාන අතර වෝල්ටීයතාව 1 mV වේ.

ඉහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ කුමක් ද/කුමන ඒවා ද?

(1) A පමණි. (2) A සහ B පමණි. (3) C සහ D පමණි.
(4) A, B සහ D පමණි. (5) B, C සහ D පමණි.

● පහත විස්තරය හා රූප සටහන සැලකීමෙන් ප්‍රශ්න අංක **40** සහ **41** සඳහා පිළිතුරු සපයන්න.

"ශ්‍රී ලංකාවේ පූර්ණ විදුලි සැපයුම් බිඳ වැටීමක් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා වූ කාර්යයක දී විදුලි ඉංජිනේරු කණ්ඩායමක් පහත දැක්වෙන ජාලක උප පොලක (Grid substation) තනි රේඛා සටහන සැලකිල්ලට ගනිති. ඔවුන්ගේ නිරීක්ෂණයට භාජනය වන්නේ තෙකලා පරිණාමකයේ තත්ත්වය, පරිපථ බිඳින, වෙන්කරණ සහ නියදඬු ......"





**40.** ඉහත තනි රේඛා රූප සටහනේ *A* යනු,

(1) පරිපථ බිඳිනය වේ.
(2) $SF_6$ පරිපථ බිඳිනය වේ.
(3) වායු පරිපථ බිඳිනය වේ.
(4) නිය දඬුව වේ.
(5) වෙන්කරණය වේ.

**41.** ඉහත තනි රේඛා රූප සටහනේ *B* යනු,

(1) පරිපථ බිඳිනය වේ.
(2) නිය දඬුව වේ.
(3) පරිණාමකය වේ.
(4) විදුලි බුබුල වේ.
(5) ප්‍රතිරෝධකය වේ.

**42.** පහත පරිපථයේ $V_o$ ප්‍රතිදාන වෝල්ටීයතාව කුමක් ද?




(1) −30 V (2) −25 V (3) 2 V (4) 10 V (5) 30 V

**43.** පහත බූලිය ප්‍රකාශනයට බූලිය ප්‍රමේයය යෙදීමෙන් ලබා ගත හැකි සමතුල්‍ය ප්‍රකාශනය කුමක් ද?

$$f(x,y,z) = xyz + \bar{x}yz + \overline{y}\overline{z} + y\overline{z}$$

(1) $xy + \overline{yz}$ (2) $yz + \overline{y}\overline{z}$ (3) $x + \overline{z}$ (4) $yz + \overline{z}$ (5) $xyz + \overline{y}\overline{z}$

**44.** 1100 W තාපකයක් දිනපතා පැය 1 ක් ජලය රත් කිරීම සඳහා යොදා ගැනේ. විදුලි බිල අඩු කිරීම සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පද්ධතියක් ද ස්ථාපනය කර ඇත. සූර්ය බල ඒකකයෙන් දිනපතා සැපයෙන 100 W අඩු කලවිට මාසික (දින 30) විදුලි පරිභෝජනය කොපමණ ද?

(1) 0.3 kWh (2) 3 kWh (3) 30 kWh (4) 33 kWh (5) 66 kWh

**45.** ප්‍රේරණ මෝටරයක් සඳහා වන පිරිවිතර වගුව කුමක් ද?

(1)

| | |
|---|---|
| කලා | $1\phi$ |
| ඇම්පියර | 1 A |
| වෝල්ට් | 230 V |
| සංඛ්‍යාතය | 50 Hz |
| ජවය | 0.5 kW |
| මිනිත්තුවක වාර | 1200 |

(2)

| | |
|---|---|
| සංඛ්‍යාතය | 50 Hz |
| අනුපාතය | 230 V/12 V |
| ජවය | 0.5 kW |

(3)

| | |
|---|---|
| වෝල්ට් | 1 – 24 V±1% |
| ධාරාව | 0 – 10 A |

(4)

| | |
|---|---|
| වෝල්ට් | 0 – 230 V AC |
| ධාරාව | 10 A |
| සංඛ්‍යාතය | 50, 60 Hz |

(5)

| | |
|---|---|
| ජවය | 5 W |
| ආලෝක ප්‍රතිදානය | 1000 |
| ආයු කාලය | 1000 h |

**46.** අධි වෝල්ටීයතා ස්ථාපන සඳහා භාවිත උපකරණ සහිත වරණය තෝරන්න.

(1) $SF_6$ ධාරා පරිපථ බිඳිනය, තෙල් පරිපථ බිඳිනය සහ වායු පරිපථ බිඳිනය


(2) ක්ෂේත්‍ර ධාරා පරිපථ බිඳිනය, ට්‍රාන්සිස්ටරය සහ ඩයෝඩය

(3) ධාරිත්‍රකය, දෝලනෝක්ෂය සහ ට්‍රාන්සිස්ටරය

(4) $SF_6$ ධාරා පරිපථ බිඳිනය, දෝලනෝක්ෂය සහ ට්‍රාන්සිස්ටරය

(5) තෙල් පරිපථ බිඳිනය, දෝලනෝක්ෂය සහ ට්‍රාන්සිස්ටරය.

**47.** පහත දක්වා ඇති පරිපථය සම්බන්ධ ප්‍රකාශ සලකන්න. මෙම LDR හි ප්‍රතිරෝධය අඳුරේ දී 1 MΩ සහ හිරුඑළියේ දී 100 Ω වේ.





A - කාරකාත්මක වර්ධකය සංසන්දකයක් ලෙස ක්‍රියා කරයි.
B - කාරකාත්මක වර්ධකය අපවර්තිත නොවන වර්ධකයක් ලෙස ක්‍රියා කරයි.
C - LDR ය අඳුරේ තිබිය දී LED ය දැල්වේ.

නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ සහිත වරණය කුමක් ද?

(1) A පමණි. (2) C පමණි. (3) A සහ B පමණි.
(4) A සහ C පමණි. (5) B සහ C පමණි.

**48.** රූපයේ දක්වා ඇති ආකාරයට $A$ සහ $B$ සන්නායක දෙකක් හා $R_1$ සහ $R_2$ ප්‍රතිරෝධක දෙකක් සම්බන්ධ කර ඇත. $R_1$ සහ $R_2$ සඳහා ඇමුණුම් රැහැන් ප්‍රතිරෝධය ශුන්‍ය වූ පරිපූර්ණ සන්නායක ලෙස සලකන්න.




| සන්නායකය | හරස් කැපුම | දිග | ප්‍රතිරෝධකතාව |
|---|---|---|---|
| $A$ | 2 a | $l$ | $\rho$ |
| $B$ | a | $2\,l$ | $\rho$ |

| ප්‍රතිරෝධකය | ප්‍රතිරෝධය |
|---|---|
| $R_1$ | $10\,\Omega$ |
| $R_2$ | $100\,\Omega$ |


$P$ සහ $Q$ අතර සමස්ත ප්‍රතිරෝධය කුමක් ද?

(1) $\frac{\rho l}{a} + 110$    (2) $\frac{2\rho l}{a} + 110$    (3) $\frac{5\rho l}{2a} + 110$


(4) $\frac{5\rho l}{2a} + 100$    (5) $\frac{\rho l}{a} + 10$


- ප්‍රශ්න අංක **49** සහ **50** පහත ක්‍රියාවලිය මත පදනම් වේ.


වාහකයක් මඟින් පහත දක්වා ඇති ආකාරයට ද්‍රව්‍ය චලනය කරනු ලබයි. ද්‍රව්‍ය වල ප්‍රමාණ හඳුනා ගැනීම සඳහා $S_1$, $S_2$ සහ $S_3$ යන සංවේදක ස්ථාන ගත කර ඇත. සංවේදක හරහා ද්‍රව්‍ය ගමන් කරන විට ඒවායේ ප්‍රතිදානය තාර්කික '1' වේ.






**49.** ඉහත පෙන්වා ඇති ද්‍රව්‍ය කුනේ අනුපිළිවෙල සඳහා සංවේදක ප්‍රතිදාන වල නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.

(1)




(2)



(3)




(4)




(5)



**50.** ද්‍රව්‍ය වල වෙනත් අනුපිළිවෙළක් සඳහා $S_1$, $S_2$ හා $S_3$ හි පහත ප්‍රතිදාන සලකන්න.






නිවැරදි ද්‍රව්‍ය අනුපිළිවෙළ සහිත පිළිතුර තෝරන්න.

(1) 

(2) 

(3) 

(4) 

(5) 

❊ ❊ ❊

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை- 2020

## නව හා පැරණි නිර්දේශ/ புதிய / பழைய பாடத்திட்டம

විෂයය අංකය / பாட இலக்கம் : 16

විෂයය / பாடம் : විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I


| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 5 | 41. | 1 |
| 02. | 2 | 12. | 4 | 22. | 1 | 32. | 2 | 42. | 4 |
| 03. | 4 | 13. | 4 | 23. | 5 | 33. | 5 | 43. | 4 |
| 04. | 1 | 14. | 5 | 24. | 2 | 34. | 3 | 44. | All |
| 05. | 3 | 15. | 2 | 25. | 2 | 35. | 2 | 45. | 1 |
| 06. | 5 | 16. | 4 | 26. | 1 | 36. | 5 | 46. | 1 |
| 07. | 3 | 17. | 3 | 27. | 2 | 37. | 3 | 47. | 1 |
| 08. | 1 | 18. | All | 28. | 4 | 38. | 2 | 48. | 3 |
| 09. | 1 | 19. | 1 | 29. | 4 | 39. | 2 | 49. | 1 |
| 10. | 2 | 20. | 5 | 30. | 3 | 40. | 5 | 50. | 2 |

✪විශේෂ උපදෙස්/விசேட அறிவுறுத்தல் :
එක් පිළිතුරකට/ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50= 50


## A කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)


1. සැහැල්ලු වානේ වලින් සාදන ලද අල්ලුවක සමාංගක පෙනුමක් රූප සටහනේ දැක්වේ. X-X හරහා යන සිරස් තලය වටා අල්ලුව සමමිතික වේ. නොදක්වා ඇති මාන උපකල්පනය කරමින් සුදුසු පරිමාණයක් යොදා ප්‍රථම කෝණ සෘජු ප්‍රක්ෂේපණ මූලධර්ම භාවිතා කොට පහත සඳහන් පෙනුම අඳින්න. සියලු අදාළ මිනුම් දක්වන්න. ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා 3 සහ 4 පිටුවල ඇති ප්‍රස්තාර කඩදාසි භාවිත කරන්න. (සියලු මිනුම් මිලිමීටරවලින් දක්වා ඇත.)




(i) A දෙසින් පෙනෙන ඉදිරි පෙනුම
(ii) B දෙසින් පෙනෙන පැති පෙනුම
(iii) සැලැස්ම




පැති පෙනුම		ඉදිරි පෙනුම




| | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | [illegible] | |
|---|---|---|---|---|---|---|---|
| පැති පෙනුම | 6 | 6 | 3 | 5 | 5 | -- | 25 |
| ඉදිරි පෙනුම | 12 | 4 | 2 | 5 | 5 | -- | 28 |
| සැලැස්ම | 17 | 4 | 6 | 5 | 5 | --<br>10 | 37<br>10 |
| එකතුව | | | | | | | 100 |

සැලැස්ම

2. කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ පාසැලක මාර්ගගත පන්ති පැවැත්වීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ඔබට පැවරී ඇතැයි සිතන්න. ඒ සඳහා අවශ්‍යතා පහත දක්වා ඇත.

❊ පාසැල් වෙබ් අඩවියට උඩුගත කිරීම සඳහා නියමිත වීඩියෝ පාඩම් පටිගත කිරීමේ කාමරයක්

❊ මාර්ගගත පන්ති තථ්‍ය කාලව (realtime) පැවැත්වීම සඳහා ගුරු භවතුන්ට කාමරයක්. සිසුන්ට අන්තර්-ක්‍රියාකාරී ලෙස පන්ති වලට සහභාගී වීමට හැකි විය යුතුය.

❊ ඉගැන්වීම ආධාරක සකස් කිරීම සඳහා පරිගණක ස්ථානයක්, උදා. පවර් පොයින්ට් කදා (Power point) ඉදිරිපත් කිරීම

❊ මාර්ගගත දත්ත ගබඩා සහ මාර්ගගත ලේඛන පන්ති පැවැත්වෙන අතරතුරේ දී භාවිත කිරීමේ හැකියාව

පාසැල් කළමණාකාරීත්වය විසින් තොරතුරු තාක්ෂණ පහසුකම් සහිත කාමරයක් සැලසුම් කරන්නේ යැයි උපකල්පනය කරන්න.

(a) කාමරය තුළ මේස පරිගණක (ප්‍රධාන මධ්‍යම සැකසුම් ඒකක-CPU, මොනිටරය, යතුරු පුවරුව හා මූසිකය) සහිත ස්ථාන ඇත.

(i) එම එක් එක් ස්ථාන සඳහා අවශ්‍ය වන අමතර දෘඩාංග අයිතම **දෙකක්** සඳහන් කරන්න.

**විඩියෝ කැමරා, ජාල ගත කළහැකි කැමරා**

**මයික්‍රෆෝන්, Head Set/ ස්පීකර්, Head Set** **(10x2=20)**

(ii) මාර්ගගත පන්ති තථ්‍ය කාලව පැවැත්වීම හා පටිගත කිරීම සඳහා භාවිත කළ හැකි මෘදුකාංගයක් නම් කරන්න.

**★ දෘඩාංග සමඟ ලැබෙන මෘදුකාංග ★ පැකේජය සමඟ ලැබෙන මෘදුකාංග**

**★ තුන්වන පාර්ශවයේ මෘදුකාංග** **(20x1=20)**

ඉහත කාණ්ඩ තුනෙන් ඕනෑම එකක උදාහරණයක් සඳහා ලකුණු ලබා දෙන්න.

40

(b) (i) සිසුන්ට මාර්ගගත පන්ති සමග තථ්‍ය කාලව සම්බන්ධවීමට අවශ්‍ය අමතර දෘඩාංග **දෙකක්** නම් කරන්න.

**Router, Modem /ADSL Modem /Wire/RSS Router/Dongle (Internet)**

**මයික්‍රෆෝන්, Head Set** **(10x2=20)**

(ii) ඉහත (i) හි සඳහන් දෘඩාංග වලට අමතරව මාර්ගගත පන්ති සමග සම්බන්ධ වීම සඳහා සිසුන්ට අවශ්‍ය වන එක් පහසුකමක් සඳහන් කරන්න.

**Internet සම්බන්ධතාවක් /Internet Connection.** **(10x1=10)**

30

(c) ඉගෙනුම් ක්‍රියාකාරකම්වල දී කණ්ඩායම් ව්‍යාපෘති වාර්තාවක් සිසුන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය ඇතිව මාර්ගගතව සකස් කිරීමට අවශ්‍යව ඇත්නම් ඒ සඳහා භාවිත කළ හැකි එක් මාර්ගගත පහසුකමක් යෝජනා කරන්න.

**වලාකුළු පරිගණක සංකල්පයේ යටිතල පහසුකම් භාවිතය**
**(Google Class/Google Presentation /Google Doc)**

**ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් මගින් (LMS)** **(10x1=10)**
**(Ex : E- තක්ෂලාව,වෙබ් පාඨශාලා වැනි)**

10

(d) ගුරුවරයකු විසින් අමතර කියවීම් උපකරණ සිසුන් සමග බෙදා ගැනීමට අවශ්‍ය බවට ඉල්ලීමක් කර ඇත. මෙම අරමුණ සඳහා ඔබ යෝජනා කරන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

**වෙබ් පිටු**

**PDF ලබා දීම**


**රූප (image) ආකාරයේ** **(10x2=20)**

20

100

මෙම තීරුවේ කිසිවක් නොලියන්න පරීක්ෂකවරුන් සඳහා පමණි.

**3.** NPN ට්‍රාන්සිස්ටරයක් සහිත පරිපථයක් පහත දැක්වේ. $X$ යනු ප්‍රදානය හා $Y$ යනු ප්‍රතිදානය වේ. මෙම ට්‍රාන්සිස්ටරය සිලිකන් වලින් සාදා ඇති බව සහ $\beta = 50$ බව උපකල්පනය කරන්න. .




(a) $V_X = 0$ V නම්, ට්‍රාන්සිස්ටරය කපාහැරුම් කලාපයේ පවතින බව පෙන්වන්න.

$V_X = V_{RB} + V_{BE}$ මෙහිදී

$V_X = 0$ හා $V_{RB} \geq 0$ වේ. ⑤

මෙවිට

$V_{BE} = 0V$ වෙයි. ⑤

$V_{BE}$ නැඹුරු වෝල්ටීයතාව 0V වන බැවින් ට්‍රාන්සිස්ටරය කැපී ගිය කලාපයේ ක්‍රියාත්මක වෙයි. ⑤

15

(b) ඉහත (a) හි තත්ත්වය සඳහා $V_Y$ ප්‍රතිදාන වෝල්ටීයතාව සොයන්න. ⑤

ඉහත (a) අනුව ට්‍රාන්සිස්ටරය කැපී ගිය කලාපයේ පවතින බැවින් $I_C = 0$ වෙයි.

මෙවිට $V_{RC} = 0V$ ⑤ වන බැවින් $V_Y = 5V$ ⑤ වෙයි

15

(c) $V_X = 5$ V නම්, ට්‍රාන්සිස්ටරය සන්තෘප්ත කලාපයේ පවතින බව උපකල්පනය කරමින් $I_B$ නිශ්චය කරන්න.

$V_{RB} = I_B R_B$ හා $V_{BE} = 0.7V$ ⑤

$V_X = V_{RB} + V_{BE}$ ⑤

$5V = I_B \times (20 \times 10^3) + 0.7V$ ⑤

$$I_B = \frac{5 - 0.7}{20 \times 10^3}$$

$I_B = 215\ \mu A$ ⑤

20

**$V_{BE} = 0.8V$ ලෙස සලකා ගණනය කල විට $I_B$ = 110 µA සඳහා ලකුණු ප්‍රදානය කරන්න.**

මෙම තීරුවේ කිසිවක් නොලියන්න පරීක්ෂකවරුන් සඳහා පමණි.

(d) ඉහත (c) තත්ත්වය සඳහා ප්‍රතිදාන වෝල්ටීයතාව $V_Y$ සොයන්න.

ඉහත (c) අනුව ට්‍රාන්සිස්ටරය සංතෘප්ත කලාපයේ පවතින අතර $V_{CE} = 0.2V$ වේ. ⑤

එමනිසා $V_Y = 0.2V$ ⑤

10

(e) ඉහත (c) හි තත්ත්වය සඳහා $I_C$ හා $I_B$ අගයන් භාවිතයෙන් ට්‍රාන්සිස්ටරය සත්‍ය වශයෙන් ම සංතෘප්ත කලාපයේ බව පෙන්වන්න.

**සටහන: මෙහි $R_C = 1\ k\Omega$ විය යුතුය. නමුත් ඒය දී නොමැත.**
**මෙහි $I_C$ සදහා සමීකරණය ලියා ඇති විටද, සහ $R_C$ සදහා අගයක් උපකල්පනය කර සාදා ඇති විටද, මුළු ලකුණු ලබා දෙන්න.**

$R_C = 1\ k\Omega$ විට පිළිතුර

$I_C = \frac{V_{CC} - V_{CE}}{R_C}$ ⑤

$I_C = \frac{5 - 0.2\ V}{1x10^3}$

$I_C = 4.8mA$ ⑤

=======

$I_B = 50 \times 0.215mA$

$= 1.75mA$ ⑤

⑤

ගනනයට අනුව $\beta I_B > I_C$ වේ. මේ අනුව ට්‍රාන්සිස්ටරය

⑤

සත්‍ය වශයෙන්ම සංතෘප්ත කලාපයේ පවතියි.

25

(f) තාර්කික '0' සඳහා වෝල්ටීයතා පරාසය 0 V සිට 0.5 V සහ තාර්කික '1' සඳහා වෝල්ටීයතා පරාසය 4.5 V සිට 5 V නම් මෙම පරිපථය NOT ද්වාරයක් ලෙස යොදා ගත හැකි ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

$V_X = 0V$ (තාර්කික 0) වන විට $V_Y = 5V$ (තාර්කික1) වේ. ⑤

එමෙන්ම

⑤

$V_X = 5V$ (තාර්කික 1) වන විට $V_Y = 0.2V$ (තාර්කික 0) වේ.

ඉහත සම්බන්ධතාව අනුව ට්‍රාන්නිස්ටරය NOT ද්වාරයක් ලෙස හැසිරෙන

බැවින් NOT ද්වාරයක් ලෙස යොදාගත හැක. ⑤


15

100

මෙම තීරුවේ කිසිවක් නොලියන්න

පරීක්ෂකවරුන් සඳහා පමණි.

**4.** පරීක්ෂණාගාර පාඩමක දී මිනුම් ආදර්ශනය කිරීම සඳහා ගුරුවරයකු විසින් පහත දැක්වෙන පරිපථය සකස් කරන ලදී.




පිළිවෙළින් $R_1$ හා $R_2$ ප්‍රතිරෝධ 100 kΩ හා 1 kΩ වේ. $L_1$ හා $L_2$ පහන් හරහා ප්‍රතිරෝධය පිළිවෙළින් 12 Ω හා 10 Ω ලෙස මැන ඇත.


(a) පහත මාන ලබාගැනීම සඳහා අවශ්‍ය උපකරණ හා ඒවාට උචිත පරාස සඳහන් කරන්න.

| | උපකරණය | පරාසය |
|---|---|---|
| (i) $R_1$ හරහා වෝල්ටීයතාව | වෝල්ට් මීටරය | 30Vdc/50 Vdc ට වැඩි DC පරාසයක් |
| (ii) $R_2$ හරහා වෝල්ටීයතාව | වෝල්ට් මීටරය | 30Vdc/50 Vdc ට වැඩි |
| (iii) $R_1$ හරහා ධාරාව | ඇම්පියර් මීටරය | 25 mA /30 mA ට වැඩි පරාසයක් |
| (iv) $R_2$ හරහා ධාරාව | ඇම්පියර් මීටරය | 25 mA /30 mA ට වැඩි පරාසයක් |

**සටහන: ප්‍රායෝගිකව භාවිතා කළ හැකි ඕනෑම පරාසයකට මුළු ලකුණු දෙන්න.** **(05x8=40)**

40

(b) පහත සපයා ඇති ඉඩෙහි පරිපථය ඇඳ, (a) හි සඳහන් කර ඇති එක් එක් මිනුම් උපකරණය සම්බන්ධ කළහැකි ආකාරය දක්වන්න.




**(05x4=20)**

20

(c) පාසැලක ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා පහත උපාංග ලබා දෙන ලදී.


- 230 V සිට 30 V අවකර පරිණාමකය
- 230 V සිට 12 V අවකර පරිණාමකය
- BJT ට්‍රාන්සිස්ටරයක්
- ඩයෝඩ අටක්
- එක් කාරකාත්මක වර්ධකයක් K
- 1000 μF ධාරිත්‍රකයක්

(i) පරිපථයේ 24 V සරල ධාරා (DC) සැපයුමක් වෙනුවට 230 V ප්‍රත්‍යාවර්ත ධාරා (AC) වලින් 24 V සරල ධාරා (DC) සැපයුමක් ලබාදීමට පූර්ණ ධාරා සෘජුකරණ (rectifier) පරිපථයක් සකස් කිරීමට අවශ්‍ය උපාංග ලැයිස්තුගත කරන්න.

| | |
|---|---|
| (a) දියෝඩ - 2 | (b) දියෝඩ 4 |
| 230/30V පරිනාමකය | 230/30V පරිනාමකය |
| 1000μF ධාරිත්‍රකය | 1000μF ධාරිත්‍රකය |

(05x3=15)

(ii) සෘජුකාරක පරිපථයේ පරිපථ සටහනක් අඳින්න.




(05x5=25)

* *

40

100

## B කොටස

5. කොවිඩ්-19 යනු මෑතක දී මුළු ලෝකයටම බලපා ඇති වසංගතයකි. මෙම වසංගත කාලය තුළ වෛරස ආසාදනය පැතිරීම වැළැක්වීම සඳහා යම් යම් තාක්ෂණික හා තාක්ෂණික නොවන පියවර ගෙන තිබේ.

(*a*) කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා 'සමාජ දූරස්ථකරණය' කෙසේ භාවිත කළේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

සංචරන සීමා කිරීම, පුද්ගල පරතරය 1m කට වඩා පවත්වා ගැනීම, ආසාදිතයන් හා ඇසුරුකළ අය නිරෝධානයට යොමු කිරීම, පොදු හා පෞද්ගලික ප්‍රවාහන මාධ්‍ය තුළ ආසන සංඛ්‍යාවෙන් අර්ධයකට වඩා අඩු මගීන් සංඛ්‍යාවක් ප්‍රවාහනය කිරීම වැනි පිළිගත හැකි කරුණු 2 ක් මතුකර දැක්වීම මගින් පැහැදිලි කිරීම.

**(ලකුණු 50 යි.)**

(*b*) වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා භාවිත කළ තවත් තාක්ෂණික නොවන ක්‍රම දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- ★ මුඛ ආවරණ පැළඳීම
- ★ සමාජය තුළ ගැවසී නිවසට ඇතුළුවීමට පෙර ඇඳුම් මාරු කිරීම.
- ★ කිවිසීමේදී වැලමිටෙන් මුඛය ආවරණය කිරීම.
- ★ මුහුණ,නාසය හා ඇස් අතින් ඇල්ලීම හා පිසදැමීමෙන් වැළකීම.
- ★ පාරිභෝජන භාණ්ඩ හැකිතරම් පෞද්ගලික පරිහරණයේ තබා ගැනීම.
- ★ වායු හුවමාරුවක් ඇති නොවන වායු සමනය සහිත කාමර තුළ පුද්ගලයන් සමූහ වශයෙන් නොගැවසීම.

වැනි පිළිගත හැකි කරුණු 2ක් කෙටියෙන් පැහැදිලි කිරීම. **(ලකුණු 20 x2 = 40)**


(*c*) වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා භාවිත කළ හැකි නව තාක්ෂණ යෙදවුම් තුනක් විස්තර කරන්න.

- ★ විෂබීජ නාශක දියර භාවිතයෙන් නිරතුරුව දෑත් පිරිසිදු කර ගැනීම.
- ★ පොදු ස්ථානවල ඇති ජල කරාම ස්වයංක්‍රීයකරණය.
- ★ සෞඛ්‍ය රක්ෂිත හා විෂබීජ නාශක දියර ඉසින සවිකල කුටිර තුලින් ආයතන තුලට ඇතුළුවීමට සැලැස්වීම.
- ★ රෝගී පුද්ගලයනට පහසුකම් සැපයීමට දුරස්ථ පාලක සහිත රොබෝ භාවිතය
- ★ විෂබීජ නාශක කිරණ සහිත කුටි තුලින් ගමන් කිරීම සැලස්සීම.

වැනි පිළිගත හැකි කරුණු 3ක් කෙටියෙන් පැහැදිලි කිරීම. **(ලකුණු 20 x3 = 60)**

**150**

**6.** ශ්‍රී ලංකාවේ මිශ්‍ර බලශක්ති සැපයුමේ, පුනර්ජනනීය බල ශක්ති සැපයුම් සංරචකය වැඩි කිරීම සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීය බලාගාර (Solar PV plants) සංවර්ධනය කරනු ලැබේ. සූර්ය බලාගාරවල අඩු ධාරිතාවක් සහිත සූර්ය පැනෙල ඒකක විශාල සංඛ්‍යාවක් එකිනෙක සම්බන්ධ කර ඇත. ප්‍රකාශ වෝල්ටීය මොඩියුලයක ප්‍රතිදාන වෝල්ටීයතාවය, ලැබෙන සූර්යාලෝක ප්‍රමාණය මත රඳා පවතී. මොඩියුලයක නාමික ජවයක් හා උපරිම ප්‍රතිදාන වෝල්ටීයතාවක් ඇත. අවශ්‍ය වෝල්ටීයතාවය හෝ ධාරා ප්‍රතිදාන ලබා ගැනීම සඳහා මෙම ඒකක ශ්‍රේණිගතව හෝ සමාන්තරගතව සම්බන්ධ කළ හැක. සූර්ය මොඩියුල රාශියක ප්‍රතිදානය සරල ධාරා ප්‍රත්‍යාවර්ත ධාරා බවට හරවන පරිවර්තකයකට යොමුකර ඉන්පසු පරිණාමකයක් මගින් අදාළ ජාලක වෝල්ටීයතාවයට පරිවර්තනය කෙරේ. (පහත දක්වා ඇති විස්තරාත්මක රූප සටහන බලන්න.)




<u>සූර්ය ප්‍රකාශ වෝල්ටීය පැනල ඒකක දත්ත (එක ඒකකයක් සඳහා)</u>

- ජවය 200 W
- වෝල්ටීයතාවය $V_{max}$ 50 V

(a) 50 kW සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලාගාරයක් සඳහා සූර්ය පැනල කොපමණ සංඛ්‍යාවක් යොදාගත යුතු යන්න ගණනය කරන්න.

පැනලයක ජව ප්‍රතිදානය = 200W

අවශ්‍ය ජව ප්‍රමාණය = 50kW = 50000W

අවශ්‍ය පැනල් සංඛ්‍යාව = $\frac{50000}{200}$ = 250

**(ලකුණු 30 යි.)**

(b) සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා ඒකකයක පළල හා දිග පිළිවෙළින් 34" හා 52" යැයි උපකල්පනය කරන්න. මෙම බලාගාරය සඳහා අවශ්‍යවන මුළු ක්ෂේත්‍රඵලය ගණනය කරන්න.

එක් පැනලයක වර්ගඵලය = 34" x 52"

පැනල 250ක වර්ගඵලය = 34" x 52" x 250 වර්ග අඟල්

හෝ = $\frac{34" \times 52" \times 250}{144}$ වර්ග අඩි

**(ලකුණු 30 යි.)**

(c) සරල ධාරා ප්‍රත්‍යාවර්ත ධාරා පරිවර්තකයට 500 V සරල ධාරා විභව අන්තරයක් අවශ්‍ය වේ. දී ඇති ප්‍රකාශ වෝල්ටීයතා (PV) මොඩියුල මගින් අවශ්‍ය වන සරල ධාරා වෝල්ටීයතාව ලබා ගැනීමට ක්‍රමයක් යෝජනා කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| පැනලයක වෝල්ටීයතාව | = | 50V | | |
| 500V ලබා ගැනීමට අවශ්‍ය ශ්‍රේණිගත කෝෂ ගණන | = | $\frac{500V}{50V}$ | = | 10 |
| මුළු ශ්‍රේණිගත කෝෂ කට්ටල සංඛ්‍යාව | = | $\frac{250}{10}$ | = | 25 |
| සමාන්තර කට්ටල ගණන | = | 25 | | |

**(ලකුණු 25 යි.)**

(d) රාත්‍රී කාලයේ ප්‍රධාන ජාලකයේ විදුලිය නොමැති විට සූර්ය බලාගාරය මගින් විදුලිය සැපයීමට ක්‍රමයක් යෝජනා කරන්න.

දිවා කාලයේදී බැටරි පද්ධතියක් ආරෝපනය කරගෙන, රාත්‍රියේදී බැටරියෙන් ලබා ගන්නා විදුලිය අපවර්තයක් මගින් අවශ්‍ය ප්‍රත්‍යාවර්තන විදුලිය බවට පත්කර භාවිතය **(ලකුණු 25 යි.)**

(e) සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා බලාගාර මගින් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න.

★ තාප හා ඩීසල් බලාගාර සඳහා අවශ්‍ය ඉන්ධන වෙනුවෙන් වැය වන විදේශ විනිමය ඉතිරි කරගත හැකිවීම

★ ඩීසල් හා තාප බලාගාර වලින් පිටවන වායු පරිසරය දුෂණය කිරීම, මෙන් පරිසර හානියක් සූර්යය පැනල මගින් ඇති නොකරයි.

★ ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය අවම වීම.

★ නඩත්තුව පහසු වීම

★ බිඳ වැටුම් අවම වීම.


වැනි පිළිගත හැකි පිළිතුරු 2ක් සඳහා **(ලකුණු 20 x 2 = 40)**

**150**

7. ප්ලාස්ටික් අප ද්‍රව්‍ය උත්පාදනය සහ අනාරක්ෂිත බැහැර කිරීම ශ්‍රී ලංකාවේ දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව ඇත. කෑම පාර්සල් එතීම සඳහා අප ආරක්ෂාකාරී ප්ලාස්ටික් භාවිත කළ ද පොලිකාබනේට් සංයෝග සහිත එම ද්‍රව්‍ය ද නියාමනයක් රහිත බැහැර ස්ථාන වල දී හානිදායක රසායනික ද්‍රව්‍ය සමග බන්ධනය වීමට ඉඩ ඇත. එයින් නිපදවෙන දියර අපද්‍රව්‍ය හා ක්ෂුද්‍ර ප්ලාස්ටික්, පෘෂ්ඨීය හා භූගත ජල නිධි ද සාමුද්‍රික පරිසරය ද දූෂණය කිරීමට ඉඩ ඇත. මෙම අපවිත්‍ර ද්‍රව්‍ය මිනිස් හා සත්ව ආහාර දාම තුලට ඇතුල් විය හැකිය.

1988 වර්ෂයේ ප්ලාස්ටික් කර්මාන්ත සමාජය විසින් සකස් කරන ලද වර්ගීකරණ පද්ධතිය පහත රූපයේ දැක්වේ.

## ප්ලාස්ටික් මත ඇති ප්‍රතිචක්‍රීකරණ සංකේත කුමක් අර්ථවත් කරනුයේ ද?




**PET, PETE**
**(Polyethylene Terephthalate)**
- සිසිල් බීම, ජලය සහ සලාද සැරසිලි බෝතල්, රටකජු බටර තැවරුම, ජෑම් භාජන .....
- සීතල හෝ උණුසුම් පානයන් ගබඩා කිරීමට සුදුසු වේ. උෂ්ණ පානයන් සඳහා යෝග්‍ය නොවේ.





**HDPE**
**(High-density Polyethylene)**
- ජලනල, කිරි, යුෂ සහ ජල බෝතල්, සිල්ලර වෙළඳසැල් කවර, සමහර හිස් සෝදුම් කාරක, බෝතල්...




**PVC**
**(Polyvinyl Chloride)**
- ආහාර ඇසුරුම් කිරීමට භාවිත නොකෙරේ.
- නළ, වයර්, ගෘහ භාණ්ඩ, රෙදි, සෙල්ලම් බඩු ...




**LDPE**
**(Low-density Polyethylene)**
- ශීතකල ආහාර මළු, තෙරපිය හැකි බෝතල් උදා, මීපැණි, අබ, ශක්තිමත් බැඳුම් සහිත ආවරණ, පුනර්භව ඇසුරුම් මුදි...




**PP**
**(Polypropylene)**
- නැවත භාවිත ක්ෂුද්‍ර තරංග උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ යෝගට් ඇසුරුම්, ඉවත ගෙන බැහැරකළ හැකි ක්ෂුද්‍ර තරංග ඇසුරුම්, බැහැරකළ හැකි කෝප්ප, පිගන්




**PS**
**(Polystyrene)**
- බිත්තර ඇසුරුම්, රටකජු ඇසුරුම්, බැහැරකළ හැකි කෝප්ප, පිගන්, තැටි, හැඳි ගෑරුප්පු, පිහි, බැහැරකළ හැකි ඉවත ගෙන යන ඇසුරුම්, ආහාර ගබඩා කිරීම සඳහා ඇසුරුම් අවකාශයන්!




**Other**
**(Often Polycarbonate or ABS)**
- බීම බෝතල්, ළදරු කිරි බෝතල්, සංයුක්ත තැටි, බිඳිය නොහැකි වීදුරු, කාච, අව් කණ්නාඩි, ඖෂධීය කණ්නාඩි සහ මෝටර් රථ ප්‍රධාන පහන්, ආරක්ෂක පළිහ, උපකරණ පුවරු

http://nowsaveouplanet.blogspot.com/2015/07/what-types-of-plastics-can-be-recycled.html

ඒ ඒ වර්ගය සඳහා වූ ප්‍රතිචක්‍රීකරණ අනුපාත වැඩිවන අංක සමග අඩුවේ. භාවිතය, එක් රැස්කිරීම, තාක්ෂණ ක්‍රමය හා එක් එක් වර්ගය සඳහා සැකසුම් වියදම මත මෙය රඳා පවතී. ප්‍රතිචක්‍රීකරණ ඵලය වෙනත් නිමි නිෂ්පාදනයක අමු ද්‍රව්‍ය ලෙස භාවිත කළ යුතුය. සංවර්ධිත ලෝකයේ සෑම වර්ගයක් සඳහා ම ප්‍රතිචක්‍රීකරණ ප්‍රතිශතය 20-40% අතර වේ. කුඩා ප්‍රමාණයක් බල ශක්ති නිෂ්පාදනය සඳහා පුලුස්සනු ලබයි. බොහොමයක් නියාමනයකින් තොර බිම් ගොඩ කිරීම්, කසල ගොඩවල් හෝ මුහුදට බැහැර වෙයි.

(i) ඉහත රූපයේ දැක්වෙන වර්ගීකරණය පදනම් කරගෙන ඔබගේ පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා, නගර සභා හෝ මහ නගර සභා) ප්‍රදේශයේ උත්පාදනය වන විවිධ කසළ වර්ගීකරණය කරන්න.

සම්ප්‍රදායික කසළ වර්ගීකරණයට වඩා ප්‍රතිචක්‍රීයකරණය කිරීම සඳහා ප්ලාස්ටික් වර්ග කිරීමේදී ද්‍රව්‍ය වර්ගය අනුව වෙන්කිරීම හා වෙන්කොට රැස්කර ගැනීම,මේ සඳහා ප්ලාස්ටික් නිෂ්පාදන වල සඳහන් අංකය පදනම් කරගනිමින් වෙන් කිරීම. අංකය හඳුනාගත නොහැකි ප්ලාස්ටික් වෙනමම රැස් කිරීම සැලැස්වීම, යන පැහැදිලි සඳහා

ඒ ඒ කසල වර්ග වලට උදාහරණ දී ඇති විටද මුළු ලකුණු ලබා දෙන්න.

**(ලකුණු 30 යි. )**

(ii) විවිධ වර්ගයේ අපද්‍රව්‍ය හැසිරවිය යුතු ආකාරය පිළිබඳව ඔබගේ පළාත් පාලන ආයතනයට යෝජනා ඉදිරිපත් කරන්න. ඒ ඒ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවට දැරීමට සිදුවිය හැකි පිරිවැය තත්ත්ව හඳුනාගන්න.

- ★ ඉවත ලන ආහාර, එළවළු, පළතුරු ආදිය ගෘහාශ්‍රිතව කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ප්‍රජාවට පහසුම් ලබාදීමට පලාත් පාලන ආයතනය කටයුතු කිරීම.
- ★ කඩදාසි හා කාඩ්බෝඩ් වෙන්කර කඩදාසි නිෂ්පාදන ආයතන වෙත යැවීමට කටයුතු සැලැස්වීම.

★ ප්ලාස්ටික් වෙන් වෙන්ව වර්ගකර රැස් කිරීම හා සෝදා පිරිසිදු කර ප්‍රතිචක්‍රීය කරණය කිරීමේ අමුද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තයක් ආරම්භ කිරීම.

★ වෙළඳ පොලවලින් බැහැර කෙරෙන එළවළු, පළතුරු හා එවැනි කසල ආයතනය මගින් කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා ගැනීම.

එවැනි පිළිගත හැකි යෝජනා 3 ක් ද එක් එක් යෝජනාවේදී ප්‍රජාවට අත්වන ආදායම් හෝ පිරිවැය පිළිබඳ විස්තර කිරීම

**(ලකුණු 20 x 3 = 60)**

(iii) සැලකිය යුතු මට්ටමකින් ප්ලාස්ටික් නොවන විකල්ප ද්‍රව්‍ය භාවිතයට හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට ඔබේ ප්‍රජාව පෙළඹවිය හැකි උපක්‍රම තුනක් සාකච්ඡා කරන්න.

★ ස්වභාවික අමුද්‍රව්‍ය වලින් තැනු ගමන් මළු හැ කඩදාසි අසුරණ ප්‍රවර්ධනයට ඒවා ආකර්ශනීය ලෙස හා කල්පවතින ලෙෂ නිපදවීම් තාක්‍ෂණයන් සුළු පිරිවැය නිෂ්පාදකයින්ට ලබා දීම.

★ ප්ලාස්ටික් භාවිතයේ හානිකර තත්ත්ව හා අවාසි පිළිබඳව පාසල් මට්ටමින් තරඟ පැවැත්වීම මගින් දැනුවත් කිරීම.


★ අපතේ දමන ප්ලාස්ටික් ද්‍රව්‍ය රැස්කරමින් ඒවායේ වටිනාකමට සරිලන විකල්ප ද්‍රව්‍යයෙන් සෑදී භාණ්ඩ ප්‍රජාවට ලබාදීම වැනි යෝජනා 3 ක් සඳහා

**(ලකුණු 20 x 3 = 60)**

**150**

## C කොටස

8. (a) ප්‍රදාන තුනක් හා ප්‍රතිදාන එකක් සහිත සංයෝජක තාර්කික පරිපථයක් (combinational logic circuit) පහත දැක් වේ.




(i) පරිපථයේ ප්‍රතිදානය $f$ සඳහා බූලීය ප්‍රකාශනය ලබා ගන්න.

③ ① ③ ① ③ ① ③

$$f = \bar{x}\,\bar{y}\bar{z} + \bar{x}\,y\bar{z} + x\,\bar{y}\bar{z} + xy\,\bar{z}$$

( ලකුණු 15යි.)

(ii) අදාළ ප්‍රත්‍යක්ෂ නියම (axioms) හා ප්‍රමේය භාවිතයෙන්, ඉහත (i) හි ලබා ගන්නා ලද බූලීය ප්‍රකාශනය $f = \bar{z}$ ලෙස සුළු කළ හැකි බව පෙන්වන්න.

$f = \bar{x}\,\bar{z}\,(\bar{y} + y) + x\,\bar{z}\,(\bar{y} + y)$ ⑩

$\bar{y} + y = 1$ බැවින් ⑤

$f = (\bar{x}\,\bar{z} \cdot 1) + (x\,\bar{z} \cdot 1)$ ⑤

$\bar{x}\,\bar{z} \cdot 1 = \bar{x}\,\bar{z}$ බැවින් ⑤

$f = \bar{x}\,\bar{z} + x\bar{z}$ ⑤

$f = \bar{z}\,(\bar{x} + x)$ ⑤

$(\bar{x} + x = 1$ බැවින්)

$f = \bar{z} \cdot 1$ ⑤

$f = \bar{z}$ ⑤

( ලකුණු 45 යි.)

(iii) මෙම පරිපථය සඳහා සත්‍යතා වගුව ව්‍යුත්පන්න කරන්න.

| X | Y | Z | f |
|---|---|---|---|
| 0 | 0 | 0 | 1 |
| 0 | 0 | 1 | 0 |
| 0 | 1 | 0 | 1 |
| 0 | 1 | 1 | 0 |
| 1 | 0 | 0 | 1 |
| 1 | 0 | 1 | 0 |
| 1 | 1 | 0 | 1 |
| 1 | 1 | 1 | 0 |

❖ නිවැරදි පේළියක් සඳහා ලකුණු 2යි,

(ලකුණු 2 x 8 = 16)

(iv) ඉහත පරිපථය භාවිත කර 0 හා 7 අතර ඉරට්ටේ සංඛ්‍යා සෙවිය හැකි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(0) 2,4,6 යන ඉරට්ටේ සංඛ්‍යා සඳහා ප්‍රතිදානය f = 1 වෙයි. ⑤

එමෙන්ම අනෙකුත් ඔත්තේ සංඛ්‍යා සඳහා ප්‍රතිදානය f = 0 වෙයි. ⑤


② ②

මේ අනුව f = 1 අවස්ථා සැලකීමෙන් ඉරට්ටේ සංඛ්‍යා සොයා ගත හැක.

( ලකුණු 14 යි.)

90

(b) (i) NAND ද්වාර භාවිතයෙන් SR පිළිපොළක (flip-flop) පරිපථයක් අඳින්න.






නිවැරදි පරිපථයට


⑩

( ලකුණු 20යි.)

(ii) ධන-කෙළවර පූරක D (positive-edge triggered) පිළිපොළක් සහ සෘණ-කෙළවර පූරණ T (negative-edge triggered) පිළිපොළක් සහිත සරල අනුක්‍රමික තාර්කික පරිපථයක් පහත දක්වා ඇත. පිළිපොළ දෙකේ ම ආරම්භක අවස්ථා '0' නම්, ආදාන සංඥා A සහ සටික (clock signals) සංඥා 'CLK' සඳහා B හා C සංඥා අඳින්න.








( ලකුණු 40යි.)

60

150

**9.** කොවිඩ්-19 වසංගතය අතරතුර මාර්ගගත ඉගැන්වීම සඳහා පහසුකම් සැලසීමට පහත වෙබ් අතුරු මුහුණත සංවර්ධනය කර ඇත. 12 වන ශ්‍රේණිය (A) හා 13 වන ශ්‍රේණිය (B) පිටු (tab) හරහා තොරතුරු ලබා ගත හැකිය.




(a) ඉහත වෙබ් අතුරු මුහුණත සංවර්ධනය සඳහා HTML Tag මගින් ක්‍රමලේඛයක් (Program) ලියන්න.


```
<HTML>
    <Head>
        <TITLE>   </TITLE>
    </Head>
    <Body>
      <Center>
        <P> මාර්ග ගත ඉගැන්වීම් ද්වාරය <Br> (Conline teaching portal) <Br>
            The High School </P>
      </Center>
        <img border ="0" Scr = "image jpg"
         with = "x" high "y"
        <Br>
        <input TYPE "Reset" VALUE="12 වන ශ්‍රේණිය">
        <Br> (A)
        <input TYPE "Reset" VALUE="13 වන ශ්‍රේණිය">
        <Br> (B)
        <h1> Student Guide: Guide PDF (link) <h1>
    </Body>
</HTML>
```

**සටහන: වෙනත් ප්‍රායෝගික පිළිතුරු සඳහාද ලකුණු දෙන්න**

**( ලකුණු 2 x 25 = 50)**

(b) PDF පාඩම් හා වීඩියෝ දේශන සහිත වෙනම වෙබ් පිටුවක් ඒ ඒ ශ්‍රේණි සඳහා සංවර්ධනය කර ඇත.

(i) 12 ශ්‍රේණියේ වෙනම පිටුවක් සඳහා පිරිසැලැස්මට (layout) කටු සටහනක් අඳින්න.




❖ <u>සටහන</u>

ඉහත උදාහරණයේ ආකාරයට ඕනෑම සැලැස්මක් නිර්මාණාත්මකව ඇඳිය හැක. මෙහි පහත දැක්වෙන විශේෂ අංක A,B,C,D, අන්තර්ගත විය යුතු අතර ඒවායෙහි නිවැරදි බව මත අදාල ලකුණු ප්‍රදානය කරන්න.

- A- පිටුවේ Title ප්‍රදර්ශණය කිරීම.
- B- වීඩියෝ ධාවකයන් ඇතුලත් කිරීම.
- C- Play, Pause,Stop,Rewind වැනි පාලක condralt කිහිපයක් සහිත.
- D- Text ප්‍රදර්ශණය සඳහා pdf රාමුවක් හෝ ප්‍රදේශවවත් නම්කර තිබීම
- E- ප්‍රධාන පිටුවට (Home Page ) මාරුවීම සඳහා පුරාකත් Link යොදා තිබීම
- අවශ්‍ය පාඩම හෝ වීඩියෝ යොදා ගැනීමට (search) පහසුකම් සලකා තිබීම

**( ලකුණු 05 x5 = 25)**

(ii) 12 ශ්‍රේණිය සඳහා වෙබ් පිටුවක් සංවර්ධනය කිරීමට HTML Tag සහිත ක්‍රමලේඛයක් ලියන්න.


```
⑤ <HTML>
   ⑤ <Head>            ⑤
        <Title> 12 වන ශ්‍රේණිය A</Title>
     </Head>
   ⑤ <Body>
        <H1> 12 වන ශ්‍රේණිය B </H1>
     </Body>
   </HTML>
```

**සටහන:** වෙනත් ප්‍රායෝගික විකල්ප සඳහාද මුළු ලකුණු දෙන්න

**(ලකුණු 05 x4 = 20)**

(c) ශිෂ්‍යයින්ගේ ප්‍රශ්න හා ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා මාර්ගගත ආකෘතියක් (online form) යෝජනා කර ඇත.

(i) මාර්ගගත ආකෘතියේ පිරිසැලැස්ම සඳහා කටු සටහනක් අඳින්න.




❖ සටහන
ඉහත උදාහරණයේ ආකාරයට ඕනෑම සැලැස්මක් නිර්මාණාත්මකව ඇඳිය හැක. මෙහි පහත දැක්වෙන විශේෂ අංක A,B,C,D, අන්තර්ගත විය යුතු අතර ඒවායෙහි නිවැරදි බව මත අදාල ලකුණු ප්‍රදානය කරන්න.

- A - පිටුවේ Title ප්‍රදර්ශණය කිරීම.
- B - ප්‍රශ්ණ හා අදහස් ඇතුල් කිරීම සඳහා "Inbox" ඇතුලත් කිරීම.
- C- Text ප්‍රදර්ශණය සඳහා pdf රාමුවක් හෝ ප්‍රදේශයක් නම්කර තිබීම
- D - ප්‍රධාන පිටුවට (Home Page ) මාරුවීම සඳහා පුරුකක් Link යොදා තිබීම
- අවශ්‍ය පාඩම හෝ විඩියෝ යොදා ගැනීමට (search) පහසුකම් සලකා තිබීම

( ලකුණු 05 **x4 = 20)**

(ii) මාර්ගගත ආකෘතිය සඳහා එක් විකල්පයක් යෝජනා කරන්න.

- ඉගෙනුම් කළමනාකරණ පද්ධති භාවිතය (LMS)
- මාර්ගගත පන්තියේදීම සාකච්ජා කිරීම.
- වෙනත් ආකාර Whatsapp, Viber

ඕනෑම එකක් සඳහා ලකුණු ලබා දෙන්න.

( ලකුණු 10 **x1 =10)**

(iii) මාර්ගගත ආකෘතිය ඔබගේ වෙබ් පිටුවට සම්බන්ධ කරන ආකාරය පැහැදිලි කරන්න. HTML ක්‍රමලේඛයේ අදාළ කොටස ලියන්න. (අදාළ කොටස පමණක්)

(5) (5)

<A HREF = "Home page.html online form">
12 වන ශ්‍රේණිය (A) </A>

(5)

❖ ඉහත ටැගය (tag-< HERF>)භාවිතය.

(10)


( ලකුණු 25)

**150**

**10.** (a) ප්‍රතිරෝධකයක් ප්‍රත්‍යාවර්ත ධාරා ප්‍රභවයකට සම්බන්ධ කළ විට සක්‍රිය ජව උත්සර්ජනය වන නමුත් පරිපූර්ණ ධාරිත්‍රකයක් හෝ පරිපූර්ණ ප්‍රේරකයක් ප්‍රත්‍යාවර්ත ධාරා ප්‍රභවයකට සම්බන්ධ කිරීමේ දී සක්‍රීය ජව උත්සර්ජනයක් සිදු නොකරයි.


(i) ප්‍රතිරෝධකයක්, පරිපූර්ණ ප්‍රේරකයක් සහ පරිපූර්ණ ධාරිත්‍රකයක් වෙන වෙනම ප්‍රත්‍යාවර්ත ධාරා සැපයුමකට සම්බන්ධ කළ විට එම එක් එක් උපාංගය හරහා සැපයුම් වෝල්ටීයතාව සහ ධාරාව දැක්වෙන දෛශික (Phasor diagram) සටහන අඳින්න.

ප්‍රතිරෝධකය





⑤

ශුද්ධ ප්‍රේරකය




⑩


ශුද්ධ ධාරිත්‍රකය





⑩

( ලකුණු 25)

(ii) ප්‍රත්‍යාවර්ත ධාරා සැපයුමකට සම්බන්ධ කර ඇති පහත රූපයේ දැක්වෙන ප්‍රතිරෝධකය (R) සහ පරිපූර්ණ ප්‍රේරකය (L) සලකන්න. දෛශික සටහන ඇඳ සැපයුම් වෝල්ටීයතාව (*V*) සහ ධාරාව (*I*) දක්වන්න.




( ලකුණු 25)




(iii) ඉහත (ii) හි සඳහන් පරිපථයේ සක්‍රීය ජවය සහ ප්‍රතික්‍රියක ජව උත්සර්ජනය සඳහා ප්‍රකාශන ලියා දක්වන්න.

සක්‍රිය ජවය    ප්‍රතික්‍රියක ජවය

P = VIcos Θ    p =VIsin Θ

**( ලකුණු 05 x2 =10)**


(iv) සක්‍රීය ජවය සහ ප්‍රතික්‍රියක ජවය මැනීමේ ඒකක මොනවා ද?

සක්‍රිය ජවය - වොට් W


ප්‍රතික්‍රියක ජවය - VAR

**( ලකුණු 05 x2 =10)**

(b) පහත රූපයේ පරිදි ප්‍රේරක විබැරක් (පරිපූර්ණ නොවන) ප්‍රත්‍යාවර්ත ධාරා සැපයුමකට සම්බන්ධ කර ඇත.




(i) දෛශික සටහන අඳින්න.




**( ලකුණු 20)**

(ii) ජව සාධකය අර්ථ දක්වන්න.

ජව සාදකය යනු ජවය සහ දෘශ්‍ය ජවය අතර අනුපාතයයි. මෙම අගය සත්‍ය ජවය හා දෘශ්‍ය ජවය අතර කෝණයේ කොස් අගය මගින් ද (CosΘ) නිරූපනය කරයි.

( ලකුණු 20)

(iii) ජව සාධකය වර්ධනය කල හැකි ආකාරය පැහැදිලි කරන්න.

සත්‍ය ජවය හා දෘශ්‍ය ජවය අතර අනුපාතය 1 සමාන කරගැනීමෙන් (CosΘ=1) ජව සාදකය දියුණු කළ හැක. මේ සඳහා පරිපථයට සුදුසු අගය සහිත ධාරිත්‍රක යෙදවිය හැක.

( ලකුණු 20)

(iv) ජව සාධකය දියුණු කිරීම දක්වා වර්ධනය කිරීමේ ප්‍රධාන වාසිය කුමක් ද? (උදා: 1)

ජවයදකය දියුණු කිරිමෙන් ප්‍රතික්‍රියක ජවය වශයෙන් වැය වන ශක්තිය ඉවත් කළ හැක. මෙවිට පද්ධතියෙන් වැය වන ශක්තිය අඩුවන බැවින් විදුලි බිල අඩුවෙයි.

( ලකුණු 20)

***